ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2010

--------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර, 2010 දෙසැම්බර් 31 දිනට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම භාරගන්නා බවට ප්‍රකාශයක් මූල්‍ය වාර්තා තුළ අන්තර්ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල වෙනම කොටසක් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) රු.21,533,040 ක් වූ පාර්තෝෂිත සඳහා ප්‍රතිපාදනය හා ඒ මත කරන ලද රු.19,296,380 ක් වූ ආයෝජන මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ නමුත් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 ට අනුකූලව විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ පාර්තෝෂිත වගකීම් පිරිවැය පිළිබඳ අදාළ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් ආදායම් බදු ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් 2006/2007 හා 2007/2008 තක්සේරු වර්ෂයයන් සඳහා ගෙවිය යුතු දඩ මුදල් සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් අත්හැර දැමීම පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 24 හි අවශ්‍යතාවයන් පරිදි හෙළිදරව් කර නොතිබුණි. 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කරන බවට විගණකාධිපතිවරයා වෙත 2010 මැයි 20 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා එවා තිබුණි.

(ඉ) දේපල, පිරියත හා උපකරණ විෂයයන් ප්‍රත්‍යාගණිත අගයට ප්‍රකාශ කර ඇතිවිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව, ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය , ස්වාධීන තක්සේරු කරුවෙකු යොදාගත්තේද යන්න අයිතමයන්හි සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරිමේදී ව්‍යවහාර කළ ක්‍රම හා වැදගත් උපකල්පන මුල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාව විසින් මෝටර් රථ 28 ක් රු.53,580,000 ක වටිනාකමකට ප්‍රත්‍යාගණනය කිරිම සම්බන්ධයෙන් එපරිදි හෙළිදරවු කර නොතිබිණි.

1.2.2 <u>ලැබිය යුතු ගිණුම්</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව සතු ජංගම වත්කම් අතුරින් 90% ක වටිනාකමක් ණයගැතියන් නියෝජනය කළ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට මුළු ණයගැති වටිනාකම රු.3,154,106,357 ක් විය. ණයගැති ශේෂයන් වාර්ෂිකව දිගින් දිගටම වර්ධනය වී තිබුණ අතර, රු.254,714,539 ක ණය ශේෂයන් වසර 02 හා 19 අතර කාල පරාසයක් දක්වා විහිදී තිබුණි. දීර්ඝකාලයක සිට පැවතෙන ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ආ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද ලේඛන අනුව ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තුවලට අදාළව ශූන්‍ය ශේෂයයන් සහිත වෙළෙඳ ණයගැතියන් ඇතුළුව 2204 දෙනෙකු පැවතුණු අතර එයින් ණයගැතියන් 866 දෙනෙකුට අදාළව රු.2,159,744,355 ක මුදලක් ලැබිය යුතු ණය ශේෂ වශයෙන් දැක්වුණි. එම ණයගැතියන් අතුරින් කොමිෂන් සභාව විසින් ශේෂ සනාථ කිරිම සඳහා 298 දෙනෙක් වෙත ලිපි යවා තිබුණු අතර, එයින් ණයගැතියන් 43 දෙනෙකු විසින් පමණක් ශේෂ සනාථ කිරීම් සිදුකර තිබුණි. එම ණය ශේෂයන්ගේ අයවීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීමක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි.

### 1.2.3 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති යනාදියට අනුකූල නොවීම් විගණනයේදී අනාවරණය විය.

| **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත 13 (8) වගන්තිය | 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව පාලක මණ්ඩලය විසින් සලකා බලා ඉදිරිපත් කළ දින සිට මාස 03 ක් ඇතුළත එහි දැක්වෙන කරුණු සම්බන්ධයෙන් සභාව ගැනීමට යෝජනා කරන්නේ කවර පියවරක්ද යන්න පිළිබඳව විගණකාධිපති වෙත දැන්විය යුතු වුවත් 2009 වාර්තාව සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) මුදල් රෙගුලාසි | |
| I. මු.රෙ. 371(අ) | නියම කර ඇති උපරිමය ව රු.20,000 සීමාව ඉක්මවා දෙන ලද අතුරු අග්‍රිම 82 ක එකතුව රු.5,604,529 ක් විය. |
| II. මු.රෙ. 371 (ඇ) | කාර්ය නිම වු වහාම අතුරු අග්‍රිමයන් පියවිය යුතු වුවද රු.2,484,209 ක එකතු වටිනාකමැති මුදලක් මාස 01 හා මාස 03 ට වැඩි කාලයක් නොපියවී පැවතුණි. |
| III. මු.රෙ. 110 | හානි පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු නොතිබුණි. |

## 02. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

### 2.1 **මූල්‍ය සමාලෝචනය**

### 2.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු.5,577,306,273 ක අතිරික්තයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.5,633,977,707 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.56,671,434 අඩුවීමක් දැක්වුණි. මීට මූලික හේතුව වී ඇතතේ බොල් ණය වෙන් කිරීම පසුගිය වර්ෂයට වඩා රුපියල් මිලියන 137.097 කින් වැඩිවීමය.

2.1.2 **මුල්‍ය කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව වසර පුරා අඛණ්ඩව විශාල අතිරික්ත මුදලක් අත රඳවාගෙන පැවතුණි. අවම වශයෙන් රු.මිලියන 216 ක් හා උපරිම වශයෙන් රු. මිලියන 2491 ක් අතර මුදලක් නිරන්තරයෙන් බැංකු ජංගම ගිණුමෙහි රැඳී පැවතුණි. ජාතික ආර්ථිකයට වඩාත් යහපත් ප්‍රතිඵල අත්වන අයුරින් මෙම ඌන උපයෝජිත මුදල් ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

(ආ) 2003 වර්ෂයේ ඉතිරිකිරීමේ බැංකු ගිණුමක තැන්පත් කරන ලද ඇමරිකන් ඩොලර් 420,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ඇමරිකන් ඩොලර් 497,186 ක් හෙවත් රු.54,881,244 දක්වා වර්ධනය වී ඇතත් එම මදල පසුගිය වසර 7 1/2 තුළදී උපයෝජනය කර නොතිබුණි. මෙමගින් 2010 වර්ෂය තුළ රු.1,643,315 ක විනිමය පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) 2005 මාර්තු 31 දිනැති අංක 1386/24 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව සෑම ක්‍රියාකරුවෙකුගෙන්ම අයකරන විදුලි සංදේශ සංවර්ධන බද්දෙන් 2/3 ක් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලද පරිදි විදුලි සංදේශ ජාල පහසුකම් නොමැති ප්‍රදේශවල හෝ එම පහසුකම් සතුටුදායක මට්ටමක නොමැති ප්‍රදේශවල විදුලි සංදේශ ජාලය සංවර්ධනය කිරීම සඳහා ආපසු ලබා දීමට හැකිව තිබුණි. කෙසේ වුවද , ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විදුලි සංදේශ ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිවල යෙදෙන බව සනාථ කිරීමෙන් තොරව සිරිතක් ලෙස බද්දෙන් 2/3 ක් තබාගෙන 1/3 ක් පමණක් බදු වශයෙන් ගෙවා තිබුණි. මේ අනුව 2003 මාර්තු 03 සිට 2010 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා එම සමාගම අඩුවෙන් ගෙවා තිබුණු බදු මුදල රු.6,671,610,884 ක් වු අතර එම මුදල් අයකර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

2.2.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22 (උ) වගන්තිය අනුව සෑම විදුලි සංදේශකරුවෙකු විසින්ම ඔවුන්ට විශේෂිත වර්ෂය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රය සඳහා සෙස් ගාස්තු හා ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු ඉදිරි වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම ගෙවිය යුතු වුවද ආයතන 06 ක් විසින් ගෙවිය යුතු තම සෙස් ගාස්තුව වු රු.190,801,708 ක එකතු මුදල මාස 01 සිට මාස 09 ක් දක්වා කාලපරාසයක් තුළද, ආයතන 04 ක් විසින් ගෙවිය යුතු තම ක්‍රියාකරු ගාස්තුව වූ රු. 236,776,650 ක මුදල මාස 03 සිට මාස 09 ක් දක්වා කාල පරාසයක් තුළද ප්‍රමාදව ගෙවා තිබුණි. යථෝක්ත ප්‍රමාදය මත අතිරේක ගාස්තුවක් අයකළ හැකි බව ක්‍රියාකරුවන් වෙත ලබාදෙන බලපත්‍රයේ සඳහන්ව ඇතත් එසේ ගාස්තු නිශ්චය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ක්‍රියාකාර බලපත්‍ර හා සෙස් ගාස්තු ප්‍රමාද වී ගෙවීම හා නොගෙවීම මත අතිරේක දඩ

මුදලක් අයකර ගැනීමේ නීතිමය බලයක් දැනට පවතින විදුලි සංදේශ පනතේ නොමැති අතර එම නීතිමය බලය ලබාගැනීමේ ක්‍රමවේදයන් විදුලි සංදේශ සංශෝධන පනතට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවට කොමිෂන් සාභාවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් 2011 ජූනි 28 දින විගණකාධිපතිවරයා වෙත එවන ලද 14 (2) (සී) කොටුම්පත් වාර්තාවට අදාල පිළිතුරු ලිපිය මගින් දක්වා තිබුණි.

(ආ) යම් විදුලි සංදේශ උපකරණයක් වෙළදාමක් වශයෙන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම ක්‍රියාකර පෙන්වීම නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම කිසිවෙකු විසින් සිදු කෙරේ නම් ඒ සඳහා 1996 අංක 27 දරන විදුලි සංදේශ පනතින් සංශෝධිත, 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබාගත යුතු වුවද එසේ බලපත්‍රයක් ලබාගැනීමකින් තොරව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ව්‍යාපාරික කටයුතුවල නිරතවන බව නිරීක්ෂණය විය. විගණනයේදී සිදු කරන ලද නියදි පරීක්ෂණයට අනුව එවන් ආයතන 37 ක් බලපත්‍ර නොමැතිව ව්‍යාපාරික කටයුතු සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය.මෙවැනි බලපත්‍රයක් නොමැතිව ව්‍යාපාරික කටයුතුවල නියැලෙන ආයතන කවරේද යන්න සොයා බලා ගාස්තු අයකර ගැනීමේ ක්‍රමවේදයක් කොමිෂන් සභාව විසින් යොදා නොතිබෙන බව නිරීක්ෂණය විය.

(ඇ) කොමිෂන් සභාව සතු ගත්මිල රු. 7,304,348 ක් වටිනා මිට්ෂුබිසි වර්ගයේ ජීප් රථයක් තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය වෙත 2005 වර්ෂයේදී මුදාහැර තිබුණි. 2003 ජූනි 02 දිනැති චක්‍රල්ඛ අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳව යහපාලනය සඳහා වු මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3.9 වගන්තියට පටහැනිව මුදාහැර ඇති මෙම වාහනය නැවත කොමිෂන් සභාව වෙත ලබාගැනීමට මෙතෙක් හැකිවී නොතිබුණි.

## 2.2.2 සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාර් සැලැස්ම.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පී.ඊ.ඩී. 47 හා 2007 දෙසැම්බර් 18 දිනැති චක්‍රලේඛය පරිදි සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ යහපාලනය පිළිබඳව මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 පරිච්ඡේදය පරිදි විස්තරාත්මකව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මක් වර්ෂය ආරම්භයට දින 15 කට ප්‍රථම විගණකාධිපති , රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ ලේකම් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලේකම් වෙත එහි පිටපත් ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. තවද කොමිෂන් සභාව සතුව දැනට පවතින සංයුක්ත සැලැස්මට අනුව කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගැනීමට හැකිවන අයුරින් සභාවේ වැදගත් අංගයන් වන මානව සම්පත්, පරිපාලනය, මූල්‍ය හා සැපයුම් යන අංශයන් හඳුනාගෙන සංයුක්ත සැලැසම පිළියෙල කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සැලසුම් ගත කාලපරිච්ඡේදය තුල ඉටුකරගත යුතු ඉලක්කයන් දැක්වෙන, ක්‍රියාකාර් සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි. තවද පවතින සංයුක්ත සැලැස්ම කාලීනව සංශෝධය

කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේදී ඉටු කර ගැනිමට බලාපොරොත්තු වූ අභිමතාර්තයන් හා ඉලක්ක කවරේද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය කොතෙක් දුරට ලඟා කරගත්තේද යන්න ඇගයීමට ලක් කර ගත නොහැකි විය.

### 2.2.3 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරුනු ලැබේ.

(අ) ලබා නොගත් නිවාඩු දීමනාව හා නිවාස ණය පොලියෙන් 2/3 ක් ප්‍රතිපුර්ණය කිරීම යන දීමනා සඳහා පිළිවෙලින් රු.3,395,212 ක් හා රු.3,669,585 ක් මහාභාණ්ඩාගාර අනුමැතිය නොමැතිව සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2007 ජුනි 13 දිනැති එහි අංක එන්එස්සීසී/3/ඊබීසී/24 දරන ලිපියෙන් පැහැදිලිව දක්වා තිබුණු පරිදි අදාළ ආයතන විසින් තම සේවකයන් වෙනුවෙන් නිවස කුලියෙන් 10% නොගෙවිය යුතුය. කෙසේ වුවද එම විධිවිධානවලට පටහැනිව කොමිෂන් සභාව විසින් එහි සේවකයන් වෙනුවෙන් නිවාස කුලී වශයෙන් රු.5,290,865 විධිමත් අධිකාර්යකින් තොරව ගෙවා තිබුණි.

### 2.2.4 නිශ්ක්‍රීය වත්කම්

රු. 30,484,695 ක පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පරිගණක හා තාක්ෂණික උපකරණ උපයෝජනයකින් තොරව පැවැති අතර මේවා පරීක්ෂා කර නැවත ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 අයවැය ලේඛනමය පාලනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අයවැයගත සංඛ්‍යා සමඟ සැසදීමේදී සැලකිය යුතු විචලනයන්ගෙන් යුක්ත වූ අතර අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබණි. ඒ පිළිබඳව නිදසුන් කිහිපයක් පහතින් දැක්වේ.

| විෂයය | අයවැය ගත සංඛ්‍යා | තථ්‍ය සංඛ්‍යා | වෙනස |
|---|---|---|---|
| -------- | -------------- | ------------- | -------- |
| | රු. | රු. | රු. |
| ආයතන හා පරිපාලන වියදම් | 141,532,930 | 287,338,563 | (145,805,633) |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම | 104,500 | 158,553,234 | (153,613,234) |
| ඒකාබද්ධ අරමුදලට ගෙවීම | 3,200,000,000 | 3,800,000,000 | (600,000,000) |
| ආයෝජන | 21,104,615,099 | 7,749,665,953 | (13,354,949,146) |
| ගෙවිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු | - | 118,458,551 | (118,458,551) |
| ගෙවිය යුතු ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු ගාස්තු | 20,742,422,424 | - | 20,742,422,424 |

03. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අයවැය

(ආ) සංයුක්ත සැලැස්ම

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම

(ඇ) අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම

(ඉ) ණයගැතියෝ